# සෞඛ්‍ය අමාත්‍යාංශයේ
# ප්‍රාථමික ශිල්පීය
# සේවා ගණය
# (PL-03- 2006 (ඒ))
# සඳහා වන
# බඳවා ගැනීමේ පරිපාටිය.

දුරකථන ) 2698475
தொலைபேசி ) 2698490
Telephone ) 2698507

ෆැක්ස් ) 2692913
பெக்ஸ் ) 2693869
Fax )

විද්‍යුත් තැපැල )
மின்னஞ்சல் முகவரி ) postmaster@health.gov.lk
e-mail )

වෙබ් අඩවිය )
இணையத்தளம் ) www.health.gov.lk
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

සෞඛ්‍ය අමාත්‍යාංශය
சுகாதார அமைச்சு
**Ministry of Health**

මගේ අංකය ) DDG(A)I/SOR/05/2011(VOL1)
எனது இல )
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය ) 2013.01.21
திகதி )
Date )

Director (Planning) 23 JAN 2013 MDPU, Ministry of Health

23 JAN 2013

අධ්‍යක්ෂ (පාලන) 04

**<u>සෞඛ්‍ය අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන ඛණ්ඩ-2 සේවා ශ්‍රේණිය PL1-2006 (ඒ) සහ PL3-2006(ඒ) වැටුප් පරිමාණය නියම කර ඇති තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය</u>**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් එවන ලද අංක PSC/EST/3/1/15/1/2012 හා 2012.12.14 දිනැති ලිපියේ මුල් පිටපත හා PL1-2006 (ඒ) සහ PL3-2006(ඒ) බඳවා ගැනීමේ පරිපාටිවල මුල් පිටපත් මේ සමඟ එවමි.

2. ඉහත බඳවා ගැනීමේ පරිපාටිවල මුල් පිටපත් ලැමිනේට් හා බයින්ඩින් කර ඔබගේ භාරයේ සුරක්ෂිතව තබා ගත යුතුය.

වී. වික්‍රමරාජා,
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) 01

පිටපත් : 1. අතිරේක ලේකම් (පාලන) - කරු.පිටපතක් අමුණා ඇත.
2. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් - කරු.පිටපතක් අමුණා ඇත.
3. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්)- සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියට ඇතුළත් කිරීම සඳහා බඳවා ගැනීමේ පරිපාටියේ පිටපතක් අමුණා ඇත.
4. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (විමර්ශන) - පිටපතක් අමුණා ඇත.
5. අධ්‍යක්ෂ (පාලන) 05 - මධ්‍යම පරිපාලන ශාඛාවේ සුරක්ෂිතව තබා ගැනීම සඳහා පිටපතක් අමුණා ඇත.
6. අධ්‍යක්ෂ (විභාග)- කාර්යක්ෂමතා කඩඉම් හා අනිකුත් උසස්වීම් විභාග සඳහා බඳවා ගැනීමේ පරිපාටියේ පිටපතක් අමුණා ඇත.

385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10. 385, வணக்கத்துக்குரிய பத்தேகம விமலவன்ச தேரோ மாவத்தை, கொழும்பு 10.
385, Rev. Baddegama Wimalawansa Thero Mawatha, Colombo 10, Sri Lanka.

දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650, 011-2136700

ලේකම් / செயலாளர் / Secretary: 011-2136602

ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2369302, 011-2369305

විද්‍යුත් තැපෑල / மின் - அஞ்சல் / E-mail: sec-psc@sltnet.lk

වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk


# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION


අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.
இல. 177, நாவல வீதி, நாராஹேன்பிட்ட, கொழும்பு 05.
No. 177, Nawala Road, Narahenpita, Colombo 05.


මගේ අංකය / எனது இல. / My No.: ප්‍රත්පීජ්/07/11/2009

ඔබේ අංකය / உமது இல. / Your No.: 2012.12. 14

දිනය / திகதி / Date:

Secretary
14 DEC 2012
Ministry of Health

Addl. Sec / Ad / DGHS

වෛද්‍ය වයි. ඩී. නිහාල් ජයතිලක

385, පූජ්‍ය බද්දේගම ... හිමි මාවත, කොළඹ 10.

ලේකම්,

සෞඛ්‍ය අමාත්‍යාංශය.

<u>බඳවා ගැනීමේ පරිපාටි අනුමත කර ගැනීම.</u>

උක්ත කරුණ සම්බන්ධ ඔබේ සමාංක හා 2012.11.30 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද, එම කොමිෂන් සභාවේ ලේකම්ගේ අත්සනින් යුත් ප්‍රාථමික ශිල්පීය සේවා ගණය (PL-3), ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණය (PL-2), ප්‍රාථමික ශිල්පීය නොවන නිලධර ගණය (PL-1) යන බඳවා ගැනීමේ පරිපාටි වල මුල් පිටපත් මේ සමඟ එවමි.

03. මේ පිළිබඳ අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ බඳවා ගැනීමේ පරිපාටිය වෙබ් අඩවියේ පළ කරන ලෙසත් චැඩිදුරටත් දන්වමි.

DGHS

Anusha Wickrathne
පී.ඒ.ඒ. වික්‍රමරත්න
සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

DDG(A) I

<u>පිටපත්</u> : 01.ආයතන අධ්‍යක්ෂ ජනරාල් (මුල් පිටපත මේ සමග එවමි)

02.ලේකම් - ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව (මුල් පිටපත මේ සමග එවමි)

03. අධ්‍යක්ෂ - සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව (මුල් පිටපත මේ සමග එවමි)

04. PSC/EST/5/1/13/3/2011 , PSC/EST/2/1/13/1/2011 , PSC/EST/3/1/15/1/2012

සෞඛ්‍ය අමාත්‍යාංශයේ

ප්‍රාථමික - ශිල්පීය සේවා ගණය සඳහා වන

බඳවා ගැනීමේ පරිපාටිය

1. සම්බන්ධ වන ආයතනය

| | | | |
|---|---|---|---|
| 1.1. | දෙපාර්තමේන්තුව :සෞඛ්‍ය සේවා | යොමු අංකය :NTA/07/11/2009 | දිනය: 2012.08.15 |
| 1.2. | අමාත්‍යාංශය :සෞඛ්‍ය | යොමු අංකය: NTA/07/11/2009 | දිනය: 2012.08.15 |
| 1.3. | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම. | යොමු අංකය: DMS/C/08/45 | දිනය: 2012.05.10 |
| 1.4. | ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය | යොමු අංකය: EST-3/RECRU/04/6640 | දිනය: 2011.07.11 |
| 1.5. | ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය | යොමු අංකය :NSCC/2/3/1/3/21 | දිනය: 2009.05.13 හා 2011.11.30 |
| 1.6. | රාජ්‍ය සේවා කොමිෂන් සභා / අමාත්‍ය මණ්ඩල අනුමැතිය | යොමු අංකය : PSC/EST/3/1/15/1/2012 | දිනය: 2012.07.27 |

2. පත් කිරීම් බලධරයා පිළිබඳ විස්තර

2.1 පත් කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්.

3. සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය : ප්‍රාථමික-ශිල්පීය සේවා ගණය

3.2 ශ්‍රේණි : III , II , I සහ විශේෂ ශ්‍රේණිය යනුවෙන් ශ්‍රේණි හතරකින් සමන්විත සේවා ගණයකි.

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :-

"ආයතනයක් වෙත පැවරෙන කාර්යයන් ඉටුකිරීම හා පවත්වාගෙන යාම සඳහා වන මූලික අවශ්‍යතාවයන් වන ඉදිකිරීම්, නඩත්තු, අලුත්වැඩියා, ආලෝකකරණය, වැනි මූලික කාර්යයන් අතුරින් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන් හි (NVQ) හතර (04) වැනි මට්ටමේ කාර්මික පුහුණු සහතිකයක් / ප්‍රවීණතා සහතිකයක් මඟින් තහවුරු කෙරෙන කාර්මික/ ශිල්පීය/ වෘත්තීය කුසලතාවයන් අවශ්‍ය වන කාර්යයන් පවරනු ලබන තැනැත්තන්ගෙන් සහ ප්‍රවාහන කාර්යයන්හිදී අවශ්‍ය වන මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කෙරෙන මෝටර් රථ රියදුරු බලපත්‍රයක් දරන තැනැත්තන්ගෙන් සමන්විත සේවා ගණයකි".

**3.4 කාර්යයන් පැවරීම -** ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත යෝග්‍යතාවය හා කුසලතාවය පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

4. තනතුරේ ස්වභාවය : ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත.

5. වැටුප්

5.1. වැටුප් කේත අංකය : PL 3 - 2006 (ඒ)

5.2. වැටුප් පරිමාණය : රු. 12,470 - 10x130-10x145-10x160-12x170-18,860

5.3. ශ්‍රේණි ක්‍රමයට අදාල ආරම්භක වැටුප් පියවර :

සටහන :- නව බඳවා ගැනීම් කළ යුත්තේ සේවක ගණයේ ආරම්භක ශ්‍රේණිය වන III ශ්‍රේණියේ ආරම්භක වැටුප් පියවරටය.

| ශ්‍රේණිය | වැටුප් පියවර | වැටුප් තලය (රුපියල්) |
|---|---|---|
| III | පියවර 01 | රුපියල් 12,470 |
| II | පියවර 12 | රුපියල් 13,915 |
| I | පියවර 22 | රුපියල් 15,380 |
| විශේෂ | පියවර 32 | රුපියල් 16,990 |

6. සේවා ගණයට අයත් තනතුර / තනතුරු

**6.1.** අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :-

| අනුමත තනතුරු නාම | අනුමත සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|
| 1. පාලන මැදිරි ක්‍රියාකරු | 19 | • ගොඩනැගිලිවල විදුලිමය නඩත්තුව හා ඒවායේ විදුලිය බිඳවැටීම් ආදිය පිළිබඳ පරීක්ෂා කිරීම, යථාතත්වයට පත් කිරීම සහ ආලෝකකරණය නිසි පරිදි පවත්වාගෙන යාම.<br>• විදුලි සෝපානවල හදිසි හිරවීමකදි පුද්ගලයින් බේරා ගැනීම සහ අත්‍යාවශ්‍ය හදිසි කටයුතු කිරීම.<br>• ජල කරාම කැඩීමක් හෝ කාන්දුවීමක් තිබේ නම් පරීක්ෂා කර යථාතත්වයට පත් කිරීම<br>• ගිනි නිවන උපකරණ හා ගිනි ගැනීම් අභවන ලාම්පු පිළිබඳ පරීක්ෂාවෙන් සිටීම.<br>• ප්‍රධාන ඔරලෝසුව ඇතුළු ඔරලෝසු පද්ධති නඩත්තු කිරීම, හා පවත්වාගෙන යාම.<br>• වායු සමීකරණ යන්ත්‍ර පද්ධති නිසි පරිදි පාලනය කිරීම, යම් දෝෂයක් ඇත්නම් එය නිවැරදි කිරීමට පියවර ගැනීම හා අඛණ්ඩව පවත්වාගෙන යාම.<br>• වතුර පොම්ප සහ යන්ත්‍ර භාවිතා කර ඇති යන්ත්‍රාගාරය පවත්වාගෙන යාම හා මධ්‍යම වායු ගබඩා පිළිබඳ සැලකිලිමත් වීම.<br>• ආයතන / අදාල අංශ ප්‍රධානියා විසින් ඔවුන් වෙත පවරනු ලබන කවර හෝ රාජකාරියක් නොපිරිහෙලා ඉටු කළ යුතුය. |

| | | |
|---|---|---|
| 2.මෝටර් කාර්මික | 11 | • සර්විස්මන් හා කම්කරුවන්ට වැඩෙහි යෙදවීම පිළිබඳ කාර්මික උපදෙස් දීම.<br>• සර්විස් කිරීමෙන් අනතුරුව කළ යුතු අළුත්වැඩියා සීරුමාරු කිරීම් වේ නම් (බ්‍රේක්, ගියර්, බ්‍රේක් වොෂර් යෙදීම, අවලම්බන ක්‍රම, බුෂ් යෙදීම, ක්ලච් සීරුමාරු කිරීම් ආදි දේ) පරීක්ෂා කර ඉටු කිරීම.<br>• අවශ්‍ය අමතර කොටස් ඇණවුම් කිරීම හා භාර ගැනීම, ඉදිරියේදි කළයුතු (ආසන්න දිනයන්හි දී) අළුත්වැඩියාවන් පිළිබඳ නිර්දේශ සහිතව සටහන් කර වැඩ ඇණවුම් අවසන් කිරීම, වාහන සර්විස් කිරීම සඳහා අවශ්‍ය පිල්ටර්, එලයිමන්ට් වැනි අමතර කොටස් තොග භාරකාරත්වය දැරීම. නිකුත් කිරීම් හා ලේඛණවල සටහන් කිරීම.<br>• ඉල්ලීම අනුව නිකුත් කිරීමේ කටයුතු ලිඛිතව කාර්යයන් ඉටු කිරීම.<br>• මෙම රාජකාරීන්ට අමතරව ප්‍රවාහන පෝමන් හෝ සහකාර පෝමන් විසින් පවරනු ලබන වෙනත් රාජකාරි ඉටු කිරීම.<br>• ආයතන / අදාල අංශ ප්‍රධානියා විසින් ඔවුන් වෙත පවරනු ලබන කවර හෝ රාජකාරියක් නොපිරිහෙලා ඉටු කළ යුතුය. |
| 3.විදුලි කාර්මික | 39 | • ආයතනයේ විදුලි උපකරණ සවි කිරීම, අළුත්වැඩියා කිරීම, විදුලි ඒකකවල/ යන්ත්‍ර වල දෝෂ හඳුනාගෙන කටයුතු කිරීම.<br>• විදුලි රැහැන් ඇදීම, ව්‍යාප්ත කිරීම, සැලසුම් කිරීම, ගොඩනැගිලි වල විදුලි අළුත් වැඩියා කිරීම.<br>• ආයතන / අංශ ප්‍රධානියා විසින් පවරනු ලබන අනෙකුත් කාර්යන් ඉටු කිරීම. |
| 4.සිනමා යන්ත්‍ර ක්‍රියාකරු | 12 | • තමා භාරයේ ඇත්තාවූ සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහන් සඳහා භාවිතා කරනු ලබන්නාවූත්, පහත සඳහන් ශ්‍රව්‍ය-දෘෂ්‍ය උපකරණ එනම් සිනමා ප්‍රොජෙක්ටරය හා සේයා තහඩු චිත්‍රපට, මහජන ඇමතුම් කට්ටලය, විදුලි ජෙනරේටරය, ශබ්ද පටි යනාදිය නිසි පරිදි සුරක්ෂිතව තබා ගැනීම හා නඩත්තු කිරීම.<br>• සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහන් සඳහා තමන් භාවිතා කරන සියළුම උපකරණවල භාරකාරත්වය පිළිබඳ වගකීම දැරීම.<br>• සෞඛ්‍ය අධ්‍යාපන සිනමා දර්ශන පැවැත්වීම හා අධීක්ෂක නිලධාරියාගේ උපදෙස් පරිදි දර්ශන පවත්වනු ලබන ස්ථාන යොදා ගෙන අවශ්‍ය කටයුතු සකස් කිරීම.<br>• ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කොට්ඨාශ වලින් ද, විශේෂිත ව්‍යාපාර හා විමධ්‍යගත කොට්ඨාශ වලින් ද එවනු ලබන සියළුම ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ සේවා කිරීමෙන් සිනමා කාර්මිකට සහය වීම.<br>• සෞඛ්‍ය අධ්‍යාපන වැඩ සටහන් වලදී ඉහත කී ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ ක්‍රියා විරහිත වීම හා ඒ ඒ අවස්ථාවලදි උචිත සුළු අළුත්වැඩියාවන් කිරීම, වැඩ සටහන් වලදි භාවිතා කිරීමට ප්‍රථමයෙන් අවශ්‍ය ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ, භාණ්ඩ චිත්‍රපට යනාදිය නිසි තත්ත්වයෙන් ක්‍රියාත්මක වේ දැයි කල්වේලා ඇතිව පරීක්ෂා කර බැලීම.<br>• සිනමා කාර්මික අංශයේ චිත්‍රපටි ඒකකය, චිත්‍රපටි පුස්තකාලය පවත්වා ගැනීම මූලස්ථානයේ සිනමා කාර්මික අංශය නිසි පරිදි පවිත්‍රව පවත්වා ගැනීම.<br>• සියළුම සෞඛ්‍ය අධ්‍යාපන හා වෙනත් වැඩ සටහන් වලට අදාල විදුලි කාර්මික රාජකාරි ඉටු කිරීම.<br>• තමා භාරයේ ඇත්තාවූ වැඩසටහන් සඳහා භාවිතා කරන්නා වූ විදුලි උපකරණ හා විදුලි ජෙනරේටරය ක්‍රියාකරවීමට අවශ්‍ය ඉන්ධන ලබා ගැනීම, භාවිතා කිරීම හා අවශ්‍ය ලේඛණ පවත්වා ගැනීම.<br>• සෞඛ්‍ය අධ්‍යාපන ප්‍රදර්ශන පැවැත්වීමට සහාය වීම, වැඩසටහන් සහ ප්‍රදර්ශන සඳහා අවශ්‍ය වන අමතර භාණ්ඩ කල් ඇතිව ලබා ගැනීම, දෙපාර්තමේන්තුව අනුග්‍රහයෙන් පවත්වනු ලබන අවශ්‍ය ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ හා ශබ්ද විකාශන යන්ත්‍ර සර්විස් කිරීම ක්‍රියාත්මක කිරීම, විදුලි ජෙනරේටරය දිවෙන කාල වේලාවන් පිළිබඳව වාර්තාවක් ලබා ගැනීම.<br>• මූලස්ථානයේ නම් ශ්‍රවනාගාරයේ සවි කොට තබා ඇති උපකරණ වල සුරක්ෂිත භාවය පිළිබඳ වගකීම දැරීම.<br>• ආයතන / අදාල අංශ ප්‍රධානියා විසින් ඔවුන් වෙත පවරනු ලබන කවර හෝ රාජකාරියක් නොපිරිහෙලා ඉටු කළ යුතුය. |

| | | |
|---|---|---|
| **5.විදුලි වෛද්‍ය යාන්ත්‍රික** | 101 | • ආයතනයේ වෛද්‍ය උපකරණ අළුත්වැඩියා කටයුතු වල තම වෘත්තියට අදාල අළුත්වැඩියාවන් ඉටු කිරීම.<br>• තමා භාරයේ ඇති යන්ත්‍ර උපකරණ හා මෙවලම් වල වගකීම් දැරීම.<br>• නියෝග කරනු ලබන පරිදි වෙනත් රජයේ වෛද්‍ය ආයතන වල වෛද්‍ය උපකරණ අළුත්වැඩියාව.<br>• ආයතන / අදාල අංශ ප්‍රධානියා විසින් ඔවුන් වෙත පවරනු ලබන කවර හෝ රාජකාරියක් නොපිරිහෙලා ඉටු කළ යුතුය. |
| 6.සෞඛ්‍ය රියදුරු | 889 | • ගිලන් රථ ඇතුළු අනෙකුත් සියළුම වාහන උපදෙස් පරිදි ධාවනය කිරිම හා දෛනික ධාවන සටහන් යාවත්කාලීනව පවත්වාගෙන යාම.<br>• ගිලන් රථ රෝගී උපස්ථාන සේවාව නිසි උපදෙස් හා ලබාදුන් පුහුණුවීම් පරිදි පවත්වාගෙන යාම.<br>• අනෙකුත් වාහන ධාවනය හා නඩත්තුව ලබා දී ඇති උපදෙස් අනුව පවත්වා ගෙන යාම හා ධාවන සටහන් පොත් නිසි පරිදි යාවත්කාලිනව පවත්වා ගෙන යාම.<br>• සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් ගිලන් රථ රියදුරන්ට පොදු චක්‍ර ලේඛ මගින් වරින් වරට පවරනු ලබන සුවිශේෂීව හඳුනා නොගත් රාජකාරි (උදා:- සුනාමි හා රටේ හදිසි තත්වයකදි ඒ සඳහා විශේෂයෙන් පැවරි ඇති රාජකාරි )<br>• ආයතන / අදාල අංශ ප්‍රධානියා විසින් ඔවුන් වෙත පවරනු ලබන කවර හෝ රාජකාරියක් නොපිරිහෙලා ඉටු කළ යුතුය.<br><br>පොදු චක්‍රලේඛ 01.08.2008 හා වි.ආර්ර් / 2005 / 06 / 15 අංක වි ආර්ර් / 11 / 2003 රාජකාරි ලැයිස්තුව අනුව රාජකාරිවල නියුතුවීම. |

**6.2** ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්ය සඳහා III, II , I හා විශේෂ ශ්‍රේණින් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවක් සේ සැලකේ.

## 07. බඳවා ගැනීම:-

7.1 බඳවා ගැනීමේ අනුපාතය :-

අ. (1) පාලන මැදිරි ක්‍රියාකරු (2) මෝටර් කාර්මික (3) විදුලි කාර්මික
(4) සිනමා යන්ත්‍ර ක්‍රියාකරු (5) විදුලි වෛද්‍ය යාන්ත්‍රික

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 50% |
| සීමිත | 50% |
| කුසලතා | අදාළ නොවේ. |

ආ. සෞඛ්‍ය රියදුරු

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 70% |
| සීමිත | 30% |
| කුසලතා | අදාළ නොවේ. |

7:2 විවෘත බඳවා ගැනීම

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.2.2 සුදුසුකම්

| | | |
|---|---|---|
| 7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් : | | එක් එක් තනතුරට අදාල සුදුසුකම් ඇමුණුම 01 |
| 7.2.2.2 වෘත්තීය සුදුසුකම් : | | |
| 7.2.2.3 පළපුරුද්ද : | | |
| 7.2.2.4 කායික සුදුසුකම් : | | |
| 7.2.2.5 වෙනත් : | | |

7.2.3 වයස :

7.2.3.1 අවම සීමාව : අවුරුදු 18

7.2.3.2 උපරිම සීමාව : අවුරුදු 45 (" රජයේ සේවයේ ස්ථිර තනතුරක් දරන අය සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ")

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය :

අ. (1) පාලන මැදිරි ක්‍රියාකරු (2) මෝටර් කාර්මික (3) විදුලි කාර්මික
(4) සිනමා යන්ත්‍ර ක්‍රියාකරු (5) විදුලි වෛද්‍ය යාන්ත්‍රික

ලිඛිත පරීක්ෂණයක හා ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. පළමුව ලිඛිත පරීක්ෂණයක් පවත්වන අතර ලිඛිත පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් අතුරින් ඔවුන් ලබා ගන්නා ලද ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් දෙගුණයක් ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණයෙන් සමත් අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයේදී ලබා ගත් ලකුණු සහ ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණයේදී ලබා ගත් ලකුණු වල එකතුවේ කුසලතා අනුපිළිවෙලට බඳවා ගනු ලැබේ.

ආ. සෞඛ්‍ය රියදුරු

ලිඛිත පරීක්ෂණයක හා ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. පළමුව ලිඛිත පරීක්ෂණයක් පවත්වන අතර ලිඛිත පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් අතරින් ඔවුන් ලබා ගන්නා ලද ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් දෙගුණයක් ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණයෙන් සමත් අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයේදී ලබා ගත් ලකුණු සහ වෘත්තීය පරීක්ෂණයේදී ලබා ගත් ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙලට බඳවා ගනු ලැබේ.

7.2.4.1 ලිඛිත විභාගය : ඇමුණුම 02

අ. (1) පාලන මැදිරි ක්‍රියාකරු (2) මෝටර් කාර්මික (3) විදුලි කාර්මික
(4) සිනමා යන්ත්‍ර ක්‍රියාකරු (5) විදුලි වෛද්‍ය යාන්ත්‍රික

| විෂයයන් | උපරිම ලකුණු | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| විෂයානුබද්ධ සාමාන්‍ය දැනීම | 100 | 40% |

ආ. සෞඛ්‍ය රියදුරු

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| මාර්ග නීති/ මෝටර් කාර්මික දැනුම | 100 | 40% |
| ප්‍රථමාධාර / ශරීරී සත්කාර.හා ප්‍රවාහන සේවා | 100 | 40% |

7.2.4.1.1 පවත්වන බලධරයා : සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය : ඇමුණුම 03

අ. (1) පාලන මැදිරි ක්‍රියාකරු (2) මෝටර් කාර්මික (3) විදුලි කාර්මික
(4) සිනමා යන්ත්‍ර ක්‍රියාකරු (5) විදුලි වෛද්‍ය යාන්ත්‍රික

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| තනතුරට අදාල දැනුම පිළිබඳ පරීක්ෂණය | 100 | 40% |

ආ. සෞඛ්‍ය රියදුරු

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| රිය පැදවීමේ නිපුණතා මැනීමේ පරීක්ෂණය | 100 | 40% |

7.2.4.2.1 පවත්වන බලධරයා :- සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

7.2.4.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :- අදාල නොවේ.

| පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අදාල නොවේ | අදාල නොවේ | අදාල නොවේ |

7.2.4.3.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා : අදාල නොවේ

7.2.4.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය (ලකුණු ලබා දෙනු නොලැබේ)
ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු : කායික යෝග්‍යතාවය හා සුදුසුකම් පරීක්ෂා කිරීම.

7.2.4.4.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරනු ලබන බලධරයා: සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්

**7.2.5** අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම සහ ආයතනයේ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මඟින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 7.3 සීමිත බඳවා ගැනීම :-

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය :- III වන ශ්‍රේණිය .

7.3.2 සුදුසුකම් :

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම් :-
7.3.2.2 වෘත්තීය සුදුසුකම් :-
7.3.2.3 පළපුරුද්ද :-
7.3.2.4 කායික සුදුසුකම් :-
7.3.2.5 වෙනත් :-

} එක් එක් තනතුරට අදාල සුදුසුකම් ඇමුණුම 04

7.3.3 බඳවා ගැනීමේ ක්‍රමය :

අ. (1) පාලන මැදිරි ක්‍රියාකරු, (2) මෝටර් කාර්මික, (3) විදුලි කාර්මික, (4) සිනමා යන්ත්‍ර ක්‍රියාකරු, (5) විදුලි වෛද්‍ය යාන්ත්‍රික

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක හා ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. පළමුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වන අතර ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් අතුරින් ඔවුන් ලබා ගන්නා ලද ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් දෙගුණයක් ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ප්‍රායෝගික වෘත්තිය පරීක්ෂණයෙන් සමත් අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගත් ලකුණු සහ ප්‍රායෝගික වෘත්තිය පරීක්ෂණයේ දී ලබා ගත් ලකුණු වල එකතුවේ කුසලතා අනු පිළිවෙලට බඳවා ගනු ලැබේ.

ආ. සෞඛ්‍ය රියදුරු

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක හා ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. පළමුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වන අතර ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් අතරින් ඔවුන් ලබා ගන්නා ලද ලකුණු වල කුසලතා අනු පිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් දෙගුණයක් ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණයෙන් සමත් අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගත් ලකුණු සහ ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණයේ දී ලබා ගත් ලකුණු වල එකතුවේ කුසලතා අනුපිළිවෙලට බඳවා ගනු ලැබේ.

7.3.3.1 ලිඛිත විභාගය :- අදාල නොවේ.

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අදාළ නොවේ | අදාළ නොවේ | අදාළ නොවේ |

7.3.3.1.1 පවත්වන බලධරයා : අදාළ නොවේ.

7.3.3.2 වෘත්තීය පරීක්ෂණය : ඇමුණුම 05

අ. (1) පාලන මැදිරි ක්‍රියාකරු (2) මෝටර් කාර්මික (3) විදුලි කාර්මික (4) සිනමා යන්ත්‍ර ක්‍රියාකරු (5) විදුලි වෛද්‍ය යාන්ත්‍රික

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| තනතුරට අදාල විෂය දැනුම | 100 | 40% |

ආ. සෞඛ්‍ය රියදුරු

| විෂයයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| රිය පැදවීමේ නිපුණතා මැනීමේ පරීක්ෂණය | 100 | 40% |

7.3.3.2.1 පවත්වන බලධරයා : සෞඛ්‍ය අමාත්‍යංශයේ ලේකම් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්.

7.3.3.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය (ලකුණු ලබා දෙනු නොලැබේ)
ඉටුකරගැනීමට අපේක්ෂිත අරමුණු : අදාල නොවේ.

7.3.3.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරනු ලබන බලධරයා: අදාල නොවේ.

7.3.3.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : ඇමුණුම 06

අ. (1) පාලන මැදිරි ක්‍රියාකරු (2) මෝටර් කාර්මික (3) විදුලි කාර්මික
(4) සිනමා යන්ත්‍ර ක්‍රියාකරු (5) විදුලි වෛද්‍ය යාන්ත්‍රික

| පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1.ජ්‍යෙෂ්ඨත්වය | 40 | 40% |
| 2.අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 35 | |
| 3.තනතුරට අදාල පළපුරුද්ද | 20 | |
| 4. සම්මුඛ පරීක්ෂණයට | 05 | |

ආ. සෞඛ්‍ය රියදුරු

| පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1.ජ්‍යෙෂ්ඨත්වය | 40 | 40% |
| 2.අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 35 | |
| 3.තනතුරට අදාල පළපුරුද්ද | 20 | |
| 4. සම්මුඛ පරීක්ෂණයට | 05 | |

7.3.3.4.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : සෞඛ්‍ය අමාත්‍යංශයේ ලේකම්

7.3.4. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : දෙපාර්තමේන්තු පොදු චක්‍රලේඛයක් මඟින් හෝ ප්‍රසිද්ධ දැන්වීමක් මඟින්

7.4 කුසලතා මත බඳවා ගැනීම : අදාළ නොවේ.

## 08. කාර්යක්ෂමතා කඩඉම

8.1.

| කළමනා කාර්යක්ෂමතා කඩඉම්ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය (ලිඛිත පරීක්ෂණය / වෘත්තීය පරීක්ෂණය / සහතික පාඨමාලා / වෙනත්) |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ගතවීමට පෙර | ලිඛිත (ඇමුණුම 07) |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II වන ශ්‍රේණියට පත්වී වසර 03 ක් ගතවීමට පෙර | ලිඛිත (ඇමුණුම 08) |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I වන ශ්‍රේණියට පත්වී වසර 05 ක් ගතවීමට පෙර | ලිඛිත (ඇමුණුම 09) |

**8.2.** කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : වසරකට දෙවරක්

**8.3.** කාර්යක්ෂමතා කඩඉම් වලට අදාල පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන් ද :

1 වන කාර්යක්ෂමතා කඩඉම
2 වන කාර්යක්ෂමතා කඩඉම
3 වන කාර්යක්ෂමතා කඩඉම
} සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

## 09. රාජ්‍ය භාෂා ප්‍රවීණතාව

9.1

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 01. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුණු නිළධාරීන් විසින් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළදී ලබා ගත යුතුය. |
| 02. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාල මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |

## 10. ශ්‍රේණි උසස් කිරීම

**10.1. III වන ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම.**

**10.1.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව.**

**10.1.1.1. සපුරාලිය යුතු සුදුසුකම් :**

I. පත්වීම ස්ථිර කර තිබීම.

II. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම.

III. අනුමත කාර්යසාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගෙන තිබීම.

VI. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2. උසස් කිරීමේ ක්‍රමය:

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය මඟින් පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

**10.1.2. සුවිශේෂී කාර්යසාධනය අනුව**

10.1.2.1. සපුරාලිය යුතු සුදුසුකම් :

I. පත්වීම ස්ථිර කර තිබීම.

II. සේවා ගණයේ III ශ්‍රේණියේ වසර හය (06) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක හය (06) ම නියමිත දිනට උපයාගෙන තිබීම.

III. අනුමත කාර්යසාධන ඇගයීමේ පටිපාටිය අනුව පූර්වාසන්නතම වසර හය (06) තුලම සුවිශේෂී කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස්වීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්වී තිබීම.

VI. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව නියමිත කාලය ඇතුලත දී ලබා ගෙන තිබීම.

10.1.2.2. උසස් කිරීමේ ක්‍රමය :-

ඉහත සුදුසුකම් සපුරාලන නිලධරයන්ට පත්කිරීම් බලධරයා විසින් අනුමත කරන ආයතනයක් විසින් පවත්වනු ලබන ලිඛිත අභියෝගාත්මක පරීක්ෂණයකට පෙනී සිටිය හැක. ඉන් සමත් වන්නන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ. අදාල සෙසු අවශ්‍යතාවයන් ද සම්පූර්ණකර ඇති නිලධරයන් පත්කිරීමේ දින සිට වසර හයක් (06) ක් සම්පූර්ණ වන දිනට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.
ලිඛිත අභියෝගාත්මක පරීක්ෂණය - ඇමුණුම 10 හි දැක්වේ.

සටහන :-

* සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස් කිරීම් ලබා දීමේදී පවත්වනු ලබන පරීක්ෂණයෙන් සමත්වීම සඳහා අවම වශයෙන් ලකුණු 60% ක් ලබා ගත යුතුය. තවද සුවිශේෂී කාර්යසාධනය යටතේ උසස් කිරීමේ පරීක්ෂණය වර්ෂයකට එක් වරක් පවත්වනු ලබන අතර නිලධරයකුට පෙනී සිටිය හැක්කේ එක් වතාවක් පමණි.

* නිලධරයකුට පාලනය කළ නොහැකි විශේෂ හේතුවක් මත නියමිත දිනට සුවිශේෂී කාර්යසාධනය යටතේ උසස් කිරීමේ පරීක්ෂණයට පෙනී සිටීමට නොහැකි වූ අවස්ථාවන්හිදී පසුව පැවැත්වෙන අභියෝගාත්මක පරීක්ෂණයට එම නිලධාරියාට පෙනී සිටිය හැක. එවැනි නිලධරයකු සුවිශේෂී කාර්යසාධනය යටතේ උසස් කිරීම සිදු කරන දිනය ලෙස සලකනුයේ එම විභාගය සමත් වූ දින වේ.

## 10.2. II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම.

### 10.2.1. සාමාන්‍ය කාර්යසාධනය අනුව,

#### 10.2.1.1. සපුරාලිය යුතු සුදුසුකම්.

I. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවය (09) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක නවය (09) ක් උපයාගෙන තිබීම.

II. පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර නවය (09) ක් තුළ සාමාන්‍ය මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

#### 10.2.1.2. උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව I ශ්‍රේණියට උසස් කිරීම සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

### 10.2.2. සුවිශේෂී කාර්යසාධනය අනුව :

#### 10.2.2.1. සපුරාලිය යුතු සුදුසුකම් :

I. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට සේවා ගණයේ II ශ්‍රේණියේ වසර අට (08) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක අට (08) ම නියමිත දිනට උපයාගෙන තිබීම.

II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. අනුමත කාර්යසාධන ඇගයීමේ පටිපාටිය අනුව පූර්වාසන්නතම වසර අට (08) තුළම සුවිශේෂී කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.2.2.2. උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් සඳහා පත්කිරීම් බලධරයා විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලබන අතර එම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් 50% ක් හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා නිලධරයන් II ශ්‍රේණියට උසස් වී වසර අට (08) ක් සම්පූර්ණ වන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ. (ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දෙන ආකාරය ඇමුණුම 11 මඟින් දැක්වේ)

සංශෝධනය : 1. සුවිශේෂී කාර්ය සාධනය ඇගයීමේ ක්‍රමවේදයක් රජය විසින් හඳුන්වාදී ක්‍රියාත්මක කරන තෙක් දැනට ක්‍රියාත්මක වන වාර්ෂික කාර්ය සාධන ඇගයීමේදී සතුටුදායක මට්ටම හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කරනු ලැබ ඇති තැනැත්තන්ට සුවිශේෂී කාර්ය සාධනය යටතේ උසස්කිරීම් සඳහා පෙනී සිටීමට අවස්ථාව සලසා දෙනු ලැබේ.

2. සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

## 10.3. I වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම.

10.3.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව :-

10.3.1.1. සපුරාලිය යුතු සුදුසුකම්.

I. සේවා ගණයේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවය (09) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක නවය (09) ක් උපයාගෙන තිබීම.

II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. අනුමත කාර්යසාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර නවය (09) තුළම සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

10.3.1.2. උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයින් විසින් නියමිත ආකෘති පත්‍රය මඟින් පත්කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

11. **තනතුරුවලට පත් කිරීම** : අදාල නොවේ.

12. **රාජ්‍ය සේවා කොමිෂන්** සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ **කොන්දේසි**

    I. මෙම සේවා ගණයට සිදු කරනු ලබන සියලුම පත්කිරීම්/බඳවා ගැනීම් මෙම බඳවා ගැනීමේ පරිපාටියෙහි විධිවිධානයන්ට තරයේ අනුකූල වන පරිදි පමණක් විය යුතුය.

13. **රාජ්‍ය සේවා කොමිෂන්** සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ **නිරූපණ** :-

"**සක්‍රිය සේවා** කාලය" යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි **සේවා කාලය** වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල **පරිච්ඡේදයන් සක්‍රිය** සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

14. **සේවයේ යෙදී සිටින්**නන් අන්තර්ග්‍රහණය කිරීම පිළිබඳව විධිවිධාන ඇමුණුම 12 හි ඇත.

15. **බඳවා ගැනීම,සේවයේ** යෙදවීම,විනය හා අනෙකුත් ආයතනික කටයුතු සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ **කොන්දේසි/රාජ්‍ය** සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 1 කාණ්ඩයේ විධිවිධාන සහ රාජ්‍ය සේවා **කොමිෂන් සභාව විසින්** වරින්වර පනවනු ලබන විධිවිධාන අදාල වේ.

16. **මෙම බඳවා ගැනීමේ** පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වේනොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය **සේවා කොමිෂන්** සභාව විමසා පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලැබේ.

සකස් කලේ :

අත්සන : C.K.Dissa (signature)

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා )

නම : ඩී.එම්.සී.කේ.දිසානායක.

තනතුර : අධ්‍යක්ෂ (පාලන) 04.

දිනය : 2012/11/26

පරීක්ෂා කලේ :

අත්සන : (signature)

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම : වී.වික්‍රමරාජා

තනතුර : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) I

දිනය : 2012.11.26

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : Y.D.N. Jayathilaka (signature)

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :

තනතුර :

දිනය : .................................... නිල මුද්‍රාව : ....................................

(stamp: ...සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් / සෞඛ්‍ය අමාත්‍යාංශයේ / ...මාවත. / "සුවසිරිපාය" / ...10.)

---

යොමු අංකය : එන්ටීඑ/07/11/2009

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රාථමික ශිල්පීය සේවා ගණය ( PL – 03- 2006 (ඒ)) තනතුරු සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : Y.D.N. Jayathilaka (signature)

නම : වෛද්‍ය වයි.ඩී.නිහාල් ජයතිලක

ලේකම්

(සෞඛ්‍ය අමාත්‍යාංශය)

දිනය : .................................... නිල මුද්‍රාව : ....................................

(stamp: වෛද්‍ය වයි. ඩී. නිහාල් ජයතිලක / ලේකම් / සෞඛ්‍ය ... / "සුවසිරිපාය" / 385, පූජ්‍ය බද්... / ...10.)

---

යොමු අංකය : ~~එන්ටීඑ/07/11/2009~~ PSC/EST/3/1/15/1/2012

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රාථමික ශිල්පීය සේවා ගණය ( PL – 03- 2006 (ඒ)) සඳහා වන මෙම බඳවා ගැනීමේ පටිපාටිය 2012 - 07 - 27 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : (signature)

නම : ....................................

ලේකම්

(රාජ්‍ය සේවා කොමිෂන් සභාව)

දිනය : 2012.12.14 නිල මුද්‍රාව : ....................................

ටී. එම්. එල්. සී. සේනාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංකය. 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ-05.

## ඇමුණුම 01

### සෞඛ්‍ය අමාත්‍යාංශයේ

### ප්‍රාථමික ශිල්පීය සේවා ගණය ( PL- 03- 2006 (ඒ) ) III වැනි ශ්‍රේණියේ අදාල තනතුරු වල විවෘත බඳවා ගැනීම සඳහා අදාල වන සුදුසුකම් 7.2.2

| | තනතුර | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|
| 01 | ශාලන මැදිරි ක්‍රියාකරු | I. අධ්‍යාපන සුදුසුකම් :- අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදි යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත්වී තිබීම.<br>II.. වෘත්තිය සුදුසුකම්:- තනතුරට අදාලව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිලිගනු ලබන කාර්මික /වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් සහතික 4 වන මට්ටම (NVQ 4) නොඅඩු මට්ටමේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබිය යුතුය.<br>III. පළපුරුද්ද :- අදාල නොවේ.<br>IV. කායික සුදුසුකම් :- සෑම අපේක්ෂකයෙකුම ශ්‍රි ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.<br>V.වෙනත් :- I. ශ්‍රි ලංකාවේ පුරවැසියකු විය යුතුය.<br>II. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.<br>III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ /ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.<br>IV. මෙම තනතුර සඳහා අයදුම් කල හැක්කේ පිරිමි අයදුම්කරුවන්ට පමණි. |
| 02 | මෝටර් කාර්මික | I. අධ්‍යාපන සුදුසුකම්:- අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදි යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත්වී තිබීම.<br>II. වෘත්තිය සුදුසුකම්:- තනතුරට අදාලව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිලිගනු ලබන කාර්මික /වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් සහතික 4 වන මට්ටම (NVQ 4) නොඅඩු මට්ටමේ ප්‍රවීනතා සහතිකයක් ලබා තිබිය යුතුය.<br>III. පළපුරුද්ද :- අදාල නොවේ. |

| | | |
|---|---|---|
| | | IV. කායික සුදුසුකම්:- සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.<br><br>V.වෙනත්:-<br>I. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.<br>II. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.<br>III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ /ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.<br>IV. මෙම තනතුර සඳහා අයදුම් කල හැක්කේ පිරිමි අයදුම්කරුවන්ට පමණි. |
| 03 | විදුලි කාර්මික | I. අධ්‍යාපන සුදුසුකම්:-අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගනනකදි යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත්වී තිබීම.<br><br>II. වෘත්තිය සුදුසුකම්:- තනතුරට අදාලව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිලිගනු ලබන කාර්මික /වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තිය සුදුසුකම් සහතික 4 වන මට්ටම (NVQ 4) නොඅඩු මට්ටමේ ප්‍රවීනතා සහතිකයක් ලබා තිබිය යුතුය.<br><br>III. පළපුරුද්ද :- අදාල නොවේ.<br><br>V. කායික සුදුසුකම් :- සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.<br><br>V.වෙනත්:-<br>I. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.<br>II. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.<br>III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ /ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.<br>IV. මෙම තනතුර සඳහා අයදුම් කල හැක්කේ පිරිමි අයදුම්කරුවන්ට පමණි. |
| 04 | [illegible] යන්ත්‍ර ක්‍රියාකරු | I. අධ්‍යාපන සුදුසුකම්:- අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගනනකදි යටත් පිරිසෙයින් |

| | | |
|---|---|---|
| | | සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත්වී තිබීම.<br><br>**II. වෘත්තිය සුදුසුකම් :-** තනතුරට අදාලව තෘතියික හා වෘත්තීක අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික /වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් සහතික 4 වන මට්ටම (NVQ 4) නොඅඩු මට්ටමේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබිය යුතුය.<br><br>III. පළපුරුද්ද :- අදාල නොවේ.<br><br>IV. කායික සුදුසුකම්:- සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.<br><br>V.වෙනත්:-<br>I. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.<br>II. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.<br>III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ /ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.<br>IV. මෙම තනතුර සඳහා අයදුම් කල හැක්කේ පිරිමි අයදුම්කරුවන්ට පමණි |
| **05** | **විදුලි වෛද්‍ය යාන්ත්‍රික** | I. අධ්‍යාපන සුදුසුකම් :- අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදි යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත්වී තිබීම.<br><br>II. වෘත්තිය සුදුසුකම් :- තනතුරට අදාලව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික /වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් සහතික 4 වන මට්ටම (NVQ 4) නොඅඩු මට්ටමේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබිය යුතුය.<br><br>III. පළපුරුද්ද :- අදාල නොවේ.<br><br>IV. කායික සුදුසුකම්:- සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.<br>V.වෙනත් :- I. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.<br>II. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය. |

| | | |
|---|---|---|
| | | III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ /ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය. |
| 06 | **සෞඛ්‍ය රියදුරු** | I. අධ්‍යාපන සුදුසුකම් :-අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගනනකදි යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත්වී තිබීම.<br><br>II. වෘත්තිය සුදුසුකම් :- I. A ශ්‍රේණියේ රියදුරු බලපත්‍රයක් තිබිය යුතුය.<br><br>III.පළපුරුද්ද :- රජයේ හෝ රජයේ අනුබද්ධිත ආයතනයකින් අවම වශයෙන් වසර 05 ක සේවා පළපුරුද්දක් තිබිය යුතුය.<br><br>IV. කායික සුදුසුකම් :-<br>I. සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් දිවා රාත්‍රී කාලයේ රාජකාරි සඳහා සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර අවශ්‍යතාවය මත පැය 24 ම සේවා මුරවලට රාජකාරි සඳහා සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.<br>II. අවම උස අඩි 05 යි අඟල් 2 ½ ක් විය යුතුය.<br>III. ඇස් පෙනීම සම්බන්ධයෙන් පහත සඳහන් උපමානවල දක්වා ඇති යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.<br><br>(අ). බර වාහන රියදුරන් බඳවා ගැනීමේදී ඇස් පෙනීම සම්බන්ධව ලංකා අක්ෂි වෛද්‍ය සංගමය පිළිගත් නිර්ණායක වන වම් ඇස සහ දකුණු ඇස 6/9 සීමාව තුළ පැවතිය යුතුය.<br>(ආ). වර්ණ අන්ධතාවය පරික්ෂා කිරීමේදී ලංකා අක්ෂි වෛද්‍ය සංගමයේ නිර්දේශිත නිර්ණායකයන් අනුව වර්ණ අන්ධතාවය නොතිබිය යුතුය<br><br>V.වෙනත්:- I. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.<br>II. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.තම පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිළධාරි ගෙන් ප්‍රාදේශිය ලේකම්ගේ අනු අත්සන සහිතව චරිත සහතිකයක් හා ප්‍රදේශයේ (පූජ්‍ය පක්ෂය ඇතුළුව) පිළිගත් ප්‍රභූවරයකු ඇතුළුව චරිත සහතික 02 ක් .<br>III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ /ගැසට් පත්‍රයේ |

| | | | |
|---|---|---|---|
| | | | සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම අංශයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.<br>IV. මෙම තනතුර සඳහා අයදුම් කල හැක්කේ ... අයදුම්කරුවන්ට පමණි. |

සකස් කළේ :

අත්සන : C.K. Dissa...

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා )

නම : ඩී.එම්.සී.කේ.දිසානායක,

තනතුර : අධ්‍යක්ෂ (පාලන) 04.

දිනය : 2012/11/26

පරීක්ෂා කළේ :

අත්සන : ...

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම : වී.වික්‍රමරාජා

තනතුර: නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) I

දිනය : 2012.11.26

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ...

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :

තනතුර :

දිනය : 2012.11.30 නිල මුද්‍රාව : ...

වෛ. ඩ. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
385, "සුවසිරිපාය"
කොළඹ 10.

ඇමුණුම 02

සෞඛ්‍ය අමාත්‍යාංශයේ

ප්‍රාථමික ශිල්පීය සේවා ගණය ( PL – 03- 2006 (ඒ) ) III වැනි ශ්‍රේණියේ (විවෘත ) බඳවා ගැනීම් සඳහා අදාල තනතුරුවල ලිඛිත විභාගය

01. විභාගයේ නම :- ප්‍රාථමික ශිල්පීය සේවා ගණය ( PL – 03- 2006 (ඒ) ) III වැනි ශ්‍රේණියේ අදාල තනතුරු වල (විවෘත ) ලිඛිත විභාගය 7.2.4 .1

02. විභාග පිළිබඳ විස්තර :-

අ. (1) පාලන මැදිරි ක්‍රියාකරු (2) මෝටර් කාර්මික (3) විදුලි කාර්මික (4) සිනමා යන්ත්‍ර ක්‍රියාකරු (5) විදුලි වෛද්‍ය යාන්ත්‍රික

| විෂයයන් | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| විෂයානුබද්ධ සාමාන්‍ය දැනීම | පැය 01 ½ | 100 | 40% |

ආ. සෞඛ්‍ය රියදුරු

| විෂයයන් | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| විෂයානුබද්ධ සාමාන්‍ය දැනීම | පැය 01 ½ | 100 | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා :- සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක් ද යන වග :- පුරප්පාඩු පිරවීමට අවශ්‍ය වූ අවස්ථාවකදී .

05. විභාගය සඳහා වන විෂය නිර්දේශ :-

අ. (1) පාලන මැදිරි ක්‍රියාකරු (2) මෝටර් කාර්මික (3) විදුලි කාර්මික (4) සිනමා යන්ත්‍ර ක්‍රියාකරු (5) විදුලි වෛද්‍ය යාන්ත්‍රික

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂයය නිර්දේශය |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | පද සංඛ්‍යා හා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටළු සම්බන්ධයෙන් අපේක්ෂකයෝ දක්වන නිගමන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටළු පිළිබඳ අර්ථාවබෝධය හා ප්‍රමාණීකරණය හා කාලය හා අවකාශය අතර සම්බන්ධතා වටහා ගැනීමෙහිලා අපේක්ෂකයකු සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. |
| විෂයානුබද්ධ සාමාන්‍ය දැනීම | තනතුරට අදාල රාජකාරි පිළිබඳ කරුණු ආශ්‍රයෙන් මෙම ප්‍රශ්න පත්‍රය සකස් වේ. |

ආ. සෞඛ්‍ය රියදුරු

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂයය නිර්දේශය |
| --- | --- |
| මාර්ග නීති මෝටර් කාර්මික දැනුම | රථවාහන ධාවනය සම්බන්ධ අත්පොත (මෝටර් රථ කොමසාරිස් දෙපාර්තමේන්තුව ) සාමාන්‍ය ප්‍රථමාධාර ලබා දීම, මෝටර් වාහන යාන්ත්‍රික විද්‍යාව |
| ප්‍රථමාධාර /රෝගී සත්කාර හා ප්‍රවාහන සේවා | ප්‍රවාහන ක්ෂේත්‍රයේ හා රෝගී සත්කාරක සේවා ජීවිත ගලවා ගැනීම සහ ප්‍රථමාධාර ලබා දීම ද ක්‍රමවත්ව රෝගීන් ප්‍රවාහනය හා ඒ සම්බන්ධ දේශීය හා ජාත්‍යන්තර ප්‍රමිතීන් මෙයට අදාල වේ. |

සකස් කළේ :

අත්සන : C.K. Dissa
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා )
නම : ඩී.එම්.සී.කේ.දිසානායක,
තනතුර : අධ්‍යක්ෂ (පාලන) 04.
දිනය : 2012/11/26

පරීක්ෂා කළේ :

අත්සන : ..................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)
නම : වී.වික්‍රමරාජා
තනතුර : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) I
දිනය : 2012.11.26

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම :
තනතුර :
දිනය : 2012.11.28 නිල මුද්‍රාව : ..................

වැ. බ. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
385, "සුවසිරිපාය"
කොළඹ 10.

## ඇමුණුම 03

## සෞඛ්‍ය අමාත්‍යාංශයේ

## ප්‍රාථමික ශිල්පීය සේවා ගණය ( PL – 03- 2006 (ඒ) ) III වැනි ශ්‍රේණියේ අදාල තනතුරු වල (විවෘත) බඳවා ගැනීම් සඳහා වෘත්තීය පරීක්ෂණය

01 විභාගයේ නම:- ප්‍රාථමික ශිල්පීය සේවා ගණය III ශ්‍රේණියේ තනතුරු වලට විවෘත බඳවා ගැනීම සඳහා වූ වෘත්තීය පරීක්ෂණය. -7.2.4.2

02. විභාග පිළිබඳ විස්තර :-

අ. (1) පාලන මැදිරි ක්‍රියාකරු (2) මෝටර් කාර්මික (3) විදුලි කාර්මික

(4) සිනමා යන්ත්‍ර ක්‍රියාකරු (5) විදුලි වෛද්‍ය යාන්ත්‍රික

| විෂයයන් | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
